**ශීර්ෂය 24 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයයන් 10 ක් සම්බන්ධයෙන් මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සංශෝධිත වියදම් ඇස්තමේන්තුවෙහි වෙනස සියයට සෘණ 30 සිට සියයට 257 දක්වා වූ පරාසයක පැවතුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළයුතු වේ. | පුරප්පාඩු සඳහා නව කාර්යය මණ්ඩල බඳවා ගැනීම්, ගමන් වියදම්, වැඩිපුර ලිපි ද්‍රව්‍ය අවශ්‍යතා මතු වීම, වෙනත් සැපයීම් සඳහා වියදම් අවශ්‍යතා වැඩි වීම, වාහන වල හදිසි අලුත්වැඩියා, මෙහෙයුම් කල්බදු අත්හිටුවීම, රාජ්‍ය සේවක සහනදායී ණය පදනම යටතේ දේපල මිලදී ගැනීම, වාහනයක් සඳහා කල්බදු වාරික ගෙවීම, ප්‍රතිපාදන 2019 අයවැයට ඇතුළත් කිරීමට නොහැකි වීම ආදී කරුණු හේතු විය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 23 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය රු.මිලියන 16 ක් වූයෙන් ඉතිරිය රු.මිලියන 7 ක් විය. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 23 සිට සියයට 100 දක්වා පරාසයක විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළයුතු වේ. | ගමන් වියදම් අවශ්‍යතා අවම වීම, විදේශීය ගමන් සඳහා සහභාගි වීම, යන්ත්‍රෝපකරණ වගකීමේ කාලය තුල පැවතීම, වාහන දීමනා ගෙවීමට ඉදිරිපත් නොවීම, අරපිරිමැස්ම, මෙහෙයුම් කල් බදු ක්‍රමය අත්හිටුවීම, මහල්වල අභ්‍යන්තර බෙදා වෙන් කිරීම්වලින් පසු ඉතිරිවීම, මිලදී ගැනීම් ප්‍රමාණය සංශෝධනය ආදී කරුණු හේතු විය. |

### 2.2 සීමා ඉක්මවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික විසර්ජන පනත ප්‍රකාරව අත්තිකාරම් කාර්යය සඳහා පනවා තිබුණු සීමාවන් ලෙස වියදමෙහි උපරිම සීමාව රු.1,200,000 ක්ද, හර ශේෂයේ උපරිම සීමාව රු.3,000,000 ක්ද වූ අතර ඊට අදාල තථ්‍ය අගයන් පිළිවෙලින් රු.2,266,762 ක් හා රු.3,287,856 ක් වීම හේතුවෙන් සීමාව ඉක්මවීම පිළිවෙලින් රු.1,066,762 ක් හා රු.287,856 ක් විය. තවද මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 5 ආකෘතියේ මෙම උපරිම සීමා අගයන් පිළිවෙලින් රු.2,100,000 ක් ලෙස හා රු.4,000,000 ක් ලෙස සටහන් කර තිබූ බවද නිරීක්ෂණය විය. | විසර්ජන පනතින් පනවා ඇති සීමාවන් තුල කටයුතු කළ යුතු වේ. | විගණන විමසුම හා එකඟ වෙමි.<br>මෙම සීමාවන් සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 03 ක් සම්බන්ධයෙන් වටිනාකම රු. 88,776 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක (iv) හි සඳහන් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළින් බැරකම් සියල්ල හෙළිදරව් කළයුතු වේ. | බැරකම් හා සැසඳීම් වලට එකග වෙමි. විගණන විමසුම හා එකඟ වෙමි. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දුනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රාජ්‍ය ආයතනයන් විසින් සිදුකරනු ලබන භාණ්ඩ හා සේවා, වැඩ , උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය සඳහා සාධාරණ අපක්ෂපාතී විනිවිදභාවයකින් සහ තරඟකාරීත්වයකින් යුතු පිරිවැය ඵලදායීත්වය සහිත ප්‍රතිපත්ති, කාර්යපටිපාටිය සහ ක්‍රියාවලි කාලානුරූපීව සම්පාදනය කිරීම යන ආයතනයේ මෙහෙවරට අදාලව ඉදිරිපත් කර තිබූ භාණ්ඩ, වැඩ හා සේවා, තොරතුරු පද්ධති හා උපදේශකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ මගපෙන්වීම් සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට නොහැකිවී තිබුණි. | අදාල මෙහෙවර ඉටුකිරීම සඳහා බලය පැවරෙන නීතිමය රාමුව සකස් වියයුතු වේ. | 2019 වර්ෂයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශ පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා සභාගත නොවීම හේතුවෙන් මෙම ගැටළුව පැන නැගී ඇති බව දන්වා සිටින අතර මෙම ක්‍රියාවලිය ප්‍රමාදවීම ප්‍රසම්පාදන කොමිෂන් සභාවට කිසිසේත් වලක්වා ගත නොහැකි හේතූන් මත සිදුවී ඇති බවද දන්වනු කැමැත්තෙමි. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**3.2.1 නව ප්‍රසම්පාදන සංග්‍රහයන් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කොමිෂන් සභාව ස්ථාපිත කර වසර 2 ක් ගතවීමෙන් පසු, භාණ්ඩ හා සේවා, වැඩ, තොරතුරු පද්ධති සඳහා මෙන්ම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට | භාණ්ඩ හා සේවා, වැඩ, තොරතුරු පද්ධති සඳහා මෙන්ම උපදේශකවරුන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම පිළිබඳ නව |

| | | | |
|---|---|---|---|
| | උපදේශකවරුන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම පිළිබඳ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි අවසන් කෙටුම්පතට කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු විය. ඒ අනුව යෝජිත නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත් රජයේ ගැසට් පත්‍රයේ පල කර මාස 3 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ නමුත් 2020 සැප්තැම්බර් මාසය වනවිටත් එම අනුමැතිය ලබාදී නොතිබුණි. | අනුමැතිය ලබාදීම තුලින් ප්‍රසම්පාදන යාන්ත්‍රනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කළ යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි අවසන් කෙටුම්පත් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහ නීතිපතිවරයාගේ එකඟතාව ඇතිව ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇතත් එය මෙතෙක් පාර්ලිමේන්තුවේ සභාගත නොවීම කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර කරුණක් බව කාරුණිකව දන්වමි. |
| (ආ) | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළියෙල කිරිම, ඖෂධ ප්‍රසම්පාදනය සඳහා ක්‍රියාපටිපාටි අත්පොත් පිළියෙල කිරිම, හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සකස් කිරීම මේ දක්වා අවසන් කිරීමට සමත් වී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම තුලින් ප්‍රසම්පාදන යාන්ත්‍රනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කළ යුතු වේ. | 2018 දී රාජ්‍ය පුද්ගල හවුල්කාරිත්වය පිළිබඳ ජාතික නියෝජිත ආයතනය (NAPP) පිහිටුවීමෙන් අනතුරුව මෙම කොමිෂන් සභාව සමඟ ඔවුන් ඇතිකර ගන්නා ලද එකඟතාව මත හවුල් ව්‍යාපෘතියක් වශයෙන් නැවත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සඳහා අදාල වන මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදී.<br>හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සකස් කිරීම පරිසර අමාත්‍යාංශය එක්ව ක්‍රියා කළ යුත්තක් වන අතර මෙතෙක් එකී අමාත්‍යාංශය මගින් හරිත නිෂ්පාදන සඳහා ඇගයීම සඳහා වන නිර්ණායකයන් පිළියෙල කර නොතිබීම හේතුවෙන් එවැනි මාර්ගෝපදේශයන් සකස් කිරීමට අපොහොසත්ව ඇත. |

## 3.3 රජයේ ආයතනවල ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රසම්පාදන සැලසුම් සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සියළු අමාත්‍යාංශවලින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රසම්පාදන සැලසුම් කැඳවීම 2018 වර්ෂයේ ආරම්භ කර තිබුනද, එම කාර්යය කාර්යක්ෂමව සිදුවී නොමැති බව පහත පරිදි දැක්විය හැකිවේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලසුම් කැඳවීම කොමිෂන් සභාවේ කාර්යයක් වන හෙයින් ඒ අනුව කටයුතු කළ යුතු වීම. | මෙහි අරමුණු සැලසුම්ගත ප්‍රසම්පාදනය අදාල ආයතනයේ අරමුණු සමඟ සමපාත වන්නේද යන්න නිශ්චය කර එකී ප්‍රසම්පාදනය ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට සඳහා තුඩු දෙන බවට සහතික කර ගැනීමයි. කෙසේ වුවද දැනට ක්‍රියාත්මක කරනු ලබන ආකාරයට මීට වඩා |

| වර්ෂය | අමාත්‍යාංශය ඇතුළුව ඒ යටතේ ඇති ආයතන සංඛ්‍යාව | ලැබුණු ක්‍රියාකාරී සැලසුම් ප්‍රමාණය | ලැබුණු ප්‍රසම්පාදන සැලසුම් ප්‍රමාණය |
|---|---|---|---|
| 2018 | 559 | 222 | 187 |
| 2019 | 512 | 218 | 249 |

වැඩි අවධානයක් ඒ ඒ ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම ලබා ගැනීමට දැක්විය යුතු බව මෙම කොමිෂන් සභාව විසින්ද නිරීක්ෂණය කර ඇත.

| | | | |
|---|---|---|---|
| (ආ) | කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රසම්පාදන සැලසුම් සමාලෝචන කටයුතු ආයතන 19 ක් සම්බන්ධයෙන් පමණක් අවසන් කර තිබූ අතර, 2019 වර්ෂය සම්බන්ධයෙන් ආයතන 11 ක සැලසුම් පමණක් සමාලෝචන කටයුතු නිමකර තිබුණි. | සමාලෝචන කටයුතු කඩිනම් කළයුතු වේ. | - එම - |
| (ඇ) | කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයට අදාළව අමාත්‍යාංශ 47 ක අවසන් කරන ලද ප්‍රසම්පාදනයන් 1471 ක් සම්බන්ධයෙන් නියදි පදනම මත පරීක්ෂා කිරීම සඳහා ප්‍රසම්පාදනයන් 83 ක් තෝරා ගෙන තිබූ අතර 2019 වර්ෂය තුළ ඉන් ප්‍රසම්පාදන 30 ක් පමණක් පරීක්ෂා කර අවසන් කර තිබුණි. | නිම කරන ලද ප්‍රසම්පාදන සම්බන්ධ පරීක්ෂා කිරීම ඉදිරි ප්‍රසම්පාදන කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීමට ඉවහල් වන හෙයින් ඒ අනුව කටයුතු කළ යුතු වීම. | - එම - |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ “වසර 2030 න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව තිබුණි. එහෙත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව තම විෂය පථයට ගැනෙන කරුණු සම්බන්ධයෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | න්‍යාය පත්‍රය හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ඇ (1) හා (2) යන අනු ව්‍යවස්ථා යටතේ පවරා ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ඉටු කරන අතර රාජ්‍ය ආයතන ක්‍රියාත්මක කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සාධාරණ බව, යුක්ති සහගත බව, පාරිදෘෂ්‍යභාවය, පිරිවැය ඵලදායකත්වය හා තරඟකාරී බව යන කරුණු ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන අතර, එම ක්‍රියාවලීන් තුළින් වක්‍ර ලෙස තිරසර සංවර්ධන අරමුණු කරා රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙය වන බව නිරීක්ෂණය කරමු.<br>කෙසේ වුවද, කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවරා ඇති බලතල කර්තව්‍ය හා කාර්ය හැරුණු විට නෛතික |

| | | |
|---|---|---|
| | | ප්‍රතිපාදන නොමැති බැවින්, තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගත් සෘජු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන බව කාරුණිකව දැනුම් දෙමි. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වන වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළයුතු අතර එපරිදි කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වේ. | අභ්‍යන්තර විගණකයෙකු පත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 5.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | ආයතනයේ යහපැවැත්ම උදෙසා විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති නිසා විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට නොහැකි වී ඇති අතර අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇතත් එයට අනුමැතිය හිමිව නොමැත. ඒ අනුව පැවරුම් පදනම මත මෙම සේවාව ලබා ගැනීමට කටයුතු කරමින් පවතියි. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂය අවසන් වනවිට අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා 05 දෙනෙකු අනියම් පදනම මතද නිලධාරීන් 09 දෙනෙක් කොන්ත්‍රාත් පදනම මතද බඳවා ගෙන තිබුණි. අනියම් පදනම මත රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරක් සඳහා නිලධාරියකු අනුමත ක්‍රමවේදයකින් තොරව බඳවා ගෙන තිබූ අතර එම නිලධාරියාට 2019 වර්ෂය තුළදී රු.213,514 ක් ගෙවීම් කර තිබුණි. | කාර්ය මණ්ඩලය පත්කිරීම විධිමත් විය යුතුය. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 (ඉ ) (1) අනු ව්‍යවස්ථාව අනුව කොමිෂන් සභාවේ කාර්ය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධාරීන් පත්කර ගැනීමට ලබාදී ඇති බලතල සැලකිල්ලට ගෙන කොමිෂන් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා එකී පත්වීම සිදු කර ඇති අතර ඒකාබද්ධ අරමුදලින් වැටුප් ගෙවීම සැලකිල්ලට ගෙන විධිමත් පරිදි කාර්ය මණ්ඩලය අනුමත කරගනු |

| | | | |
|---|---|---|---|
| | | | ලැබ ඇති බව දන්වනු කැමැත්තෙමි. |
| (ආ) | කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලය විධායක ශ්‍රේණියේ නිලධාරීන් 01 ක් හා විධායක නොවන ශ්‍රේණියේ නිලධාරීන් 02 ක් සමන්විත වීම නිසා එහි කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව නිරීක්ෂණය කෙරේ. | අධීක්ෂණ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරවා ගත යුතු වීම. | කළ යුතු වැඩ පිළිබඳ අධ්‍යනයක් සිදුකර අවශ්‍ය කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට සටහන් කරගෙන ඇත. |